# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/21 - 2021 අගෝස්තු මස 11 වැනි බදාදා - 2021.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙම නියමය මගින් 2019 දෙසැම්බර් මස 05 දිනැති 2152/32 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ III වැනි උපලේඛනය, එකී උපලේඛනයට මෙහි උපලේඛනයේ IV වන තීරුවෙහි නියම කරනු ලබන නිදහස් කිරීම්වලට යටත්ව, I හා II තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඊට අනුරූපව III වන තීරුවේ සඳහන් වූ විස්තර යටතේ නිශ්චිතව දක්වා ඇති අයිතමයන් එකතු කිරීමෙන් 2021 අගෝස්තු මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් සංශෝධනය කරමි.

2021 පෙබරවාරි මස 22 දිනැති අංක 2216/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළකරන ලද 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ වූ නියමය මෙයින් අවලංගු කරමි.

**බැසිල් රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| I<br>ස. ව. ශීර්ෂය | II<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | III<br>විස්තරය | IV<br>නිදහස් |
|---|---|---|---|
| **04.02** | | **සීනි හෝ වෙනත් රස කාරක අඩංගුකළ, හෝ සාන්ද්‍රකළ කිරි සහ යොදය** | |
| | 0402.10.00 | අඩංගු මේද ප්‍රමාණය මුළු බරින් 1.5%ට නොවැඩි පිටි, කැට හෝ වෙනත් ඝන ස්වරූපයෙන් වූ | නිදහස් |
| | | අඩංගු මේද ප්‍රමාණය මුළු බරින් 1.5%ට වැඩි පිටි, කැට හෝ වෙනත් ඝන ස්වරූපයෙන් වූ | |
| | 0402.21.00 | සීනි හෝ වෙනත් රස කාරක අඩංගු නොකළ | නිදහස් |
| | 0402.29.00 | අනෙකුත් | නිදහස් |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.